**කොවිඩ්-19 සති පාසල**

**2021 - ii වාරය - සිව්වන සතිය**

**10 ශ්‍රේණිය** **භූගෝල විද්‍යාව**

**තුන්වන පාඩම - ලෝකයේ ප්‍රධාන කෘෂිකාර්මික භූමි පරිභෝග වර්ග**

**සත්ත්ව පාලනය (පෙළ පොත පිටු අංක 44-47)**

- සත්ත්ව පාලනය ලෝකයේ පැවති පැරණිම භූමි පරිභෝග ක්‍රමයකි.
- ලෝක ජනතාවගේ ප්‍රෝටීන අවශ්‍යතා සම්පූර්ණ කිරීම සඳහා කිරි අත්‍යවශ්‍ය ආහාරයකි. ඒ සඳහා ලෝකයේ සත්ත්ව පාලනය යටතේ කිරිපට්ටි පාලනයට සුවිශේෂී ස්ථානයක් හිමි වේ.
- ලෝකයේ සංවර්ධිත රටවල් ව්‍යාපාරික කිරිපට්ටි පාලනයේ ප්‍රමුඛතාව ගෙන ඇත.
- තණබිම්වල ව්‍යාප්තිය, ජල පහසුව, පුහුණු ශ්‍රමය, නව තාක්ෂණය හා වෙළඳපල කිරිපට්ටි පාලනය ව්‍යාප්ත වීම කෙරෙහි බලපා ඇති සාධක වේ.
- කිරි ආශ්‍රිත නිෂ්පාදන සඳහා වෙළඳපොළ පුළුල් වීම කිරිපට්ටි පාලනයේ දැකගත හැකි විශේෂ ලක්ෂණයකි.

**ක්‍රියාකාරකම**

01. ලෝකයේ සත්ත්ව පාලනය යටතේ ප්‍රධාන වශයෙන් ඇති කරන සතුන් හා ඔවුන්ගෙන් ලබා ගන්නා ප්‍රයෝජන වගුගත කරන්න.
02. ලෝකයේ සෞම්‍ය කලාපීය රටවල්හි කිරිපට්ටි පාලනය දියුණුවීම කෙරෙහි බලපා ඇති සාධක තුනක් ලියන්න.
03. කිරිපට්ටි පාලනයේ විශේෂ ලක්ෂණ තුනක් ලියා ඉන් එකක් උදාහරණ සහිතව පැහැදිලි කරන්න.
04. කිරිපට්ටි පාලනය කරන රටවල් ලෝක ආකෘති සිතියමක ලකුණු කර නම් කරන්න.